සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

44 S I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# First Term Test - Grade 10 - 2019

නම : ............................................ නර්තනය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. උඩරට, පහතරට, සහ සබරගමු වන්නම් නර්තනයේ දී වඩාත් වැදගත් චලන වන්නේ
(1) සංචාරි ය (2) රිද්මයානුකූල ය (3) තාලානුකූල ය (4) ප්‍රකාශනාත්මක ය

2. පොළොන්නරු යුගයේ නර්තනයට දක්ෂ වූ රජ බිසවක් වූයේ
(1) අනුලාවතී බිසව ය (2) ලීලාවතී බිසව ය (3) රූපාවතී බිසව ය (4) සෝමාවතී බිසව ය

3. භාතිකඅභය රජු සමයේ බෝධි ස්නාන පූජාවක් සඳහා නැටුම් ගැයුම් වලින් පූජා පැවැත්වූ බව සඳහන් මූලාශ්‍රය වන්නේ
(1) සැස්සේරුව, කොරවක්ගල ය (2) මිහින්තලය පුවරු ලිපිය ය
(3) දීපවංශය ය (4) මහාවංශය ය

4. හේවිසි වාදනයේ දී භාවිතයට ගනු ලබන වාද්‍ය භාණ්ඩ වන්නේ
(1) තම්මැට්ටම, දවුල, හොරණෑව ය (2) ගැටබෙරය, හොරණෑව, දවුල ය
(3) තලිය, දවුල, හොරණෑව ය (4) යක්බෙරය, තම්මැට්ටම, ගැටබෙරය ය

5. දෙතිතේ ප්‍රභේද
(1) 1කි (2) 3කි (3) 4කි (4) 5කි

6. උඩරට වන්නම් රචනා කරන ලද්දේ....... දීය.
(1) කොළඹ යුගයේ (2) ගම්පල යුගයේ (3) කුරුණෑගල යුගයේ (4) මහනුවර යුගයේ

7. පිරිසක් එකතුව වාදන කරන අවනද්ධ භාණ්ඩය වන්නේ
(1) බංගු රබාන ය (2) ගැටබෙරය ය (3) අත් රබාන ය (3) තාලම්පට ය

8. අනාඝාතාත්මක කවි යාගනා විශේෂකි.
(1) ගොයම් කවි (2) පාරු කවි (3) පන් කවි (4) කුළු කවි

9. උඩරට හා සබරගමු සම්ප්‍රදායන් දෙකෙහිම.... යන වචනය භාවිතා වේ.
(1) අඩව්ව (2) මාත්‍රා පද (3) කස්තිරම (4) කලාසම

10. සුරල් පෑගීමෙන් කස්තිරම නර්තනය ආරම්භ වන්නේ.....
(1) 8 වෙනි සරඹයේ සිටය (2) 10 වෙනි සරඹයේ සිටය
(3) 9 වෙනි සරඹයේ සිටය (4) 12 වෙනි සරඹයේ සිටය.

11. පහත ඒවායින් කඩිප්පුවෙන් පමණක් වාදනය කරන අර්ථය දක්වෙන්නේ
(1) ආතත නමිනි (2) සුෂිර නමිනි (3) විතතාතත නමිනි (4) විතත නමිනි

12. ප්‍රශස්ති ගායනා කරනු ලැබුවේ
(1) රජුන් ඉදිරියේය (2) ගැමියන් ඉදිරියේය
(3) වන්දිභට්ටයින් ඉදිරියේය (4) ඇමතිවරු ඉදිරියේය

13. උඩරට නර්තන සම්ප්‍රදායේ කාන්තාවන්ට ශීර්ෂාභරණ පැළඳීමේ දී පළඳිනු ලබන්නේ
(1) වෙස් තට්ටුව (2) ජටාව (3) නෙත්තිමාලය (4) පායින්පත

14. බලි ශාන්ති කර්මයේ එන ගායනා විශේෂයක් වන්නේ,
(1) අයිලේ කවි (2) මඩු පුරයේ කවි (3) ග්‍රහ පංති කවි (4) අස්නෙ කවි

15. ''දෙසු දහම් ඇසුමට ඒ නිමලා'' යන කවි පදය අයත් වන්නේ
(1) චාමර (2) කුළු (3) පන්තේරු (4) රබන්

16. හම් භාවිතා නොකර සකස් කළ වාද්‍ය භාණ්ඩයකි
(1) දඬු බෙරය (2) දවුල් බෙරය (3) පොකුරු බෙරය (4) මිහිඟු බෙරය

**ප්‍රශ්න අංක 17 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වගුව ඇසුරින් තෝරන්න.**

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | ගැටබෙරය | සුසිර | තෙල්මෙ |
| 2 | තම්මැට්ටම | තොට මෙටයාම | යක් ඇනුම |
| 3 | දඬු බෙරය | යක්කම් | අඹ විදමන |

17. සුසිර වර්ගයට අයත් භාණ්ඩය දැක්වෙනුයේ
(1) 1 පේළියේ B තීරුවේ ය. (2) 2 පේළියේ C තීරුවේ ය.
(3) 3 පේළියේ A තීරුවේ ය. (4) 1 පේළියේ C තීරුවේ ය.

18. කොහොඹා කංකාරියේ නර්තන අංගයක් දැක්වෙන්නේ ඉහත වගුවේ කුමන කොටසේ ද?
(1) 1 පේළියේ C තීරුවේ ය. (2) 2 පේළියේ C තීරුවේ ය.
(3) 3 පේළියේ C තීරුවේ ය. (4) 2 පේළියේ B තීරුවේ ය.

19. සබරගමු හා දෙවොල් මඩුවේ නාට්‍යමය පෙළපාලිය ඇතුළත් වරණය තෝරන්න.
(1) 1 පේළියේ C තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.
(3) 3 පේළියේ C තීරුවේ ය. (4) 1 පේළියේ B තීරුවේ ය.

20. ආදේශ භාණ්ඩයක් ලෙස භාවිතා කරන වාද්‍ය භාණ්ඩ ඇතුළත් වරණය වනුයේ
(1) 3 පේළියේ A තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.
(3) 1 පේළියේ C තීරුවේ ය. (4) 3 පේළියේ B තීරුවේ ය.

**ප්‍රශ්න අංක 21 25 දක්වා ප්‍රශ්නවලට රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**

21. මෙම රූපයේ 1, 2, 3 අංකවලින් දැක්වෙන්නේ
(1) සුරත්තට්ටුව, දකුණු ඇස, වරපටි
(2) බෙර කඳ, බෙර පුහුල, වරපට
(3) බෙර පුහුල, බෙරකඳ, බෙර ඇස
(4) බෙර පුහුල, සුරත් තට්ටුව, දකුණු ඇස




22. ඉහත භාණ්ඩය වාදනයේ දී ''ජිං'' අක්ෂරය වාදනය වනුයේ
(1) හයි තට්ටුව මගිනි (2) සවරම මගිනි (3) දකුණු බෙර ඇස මගිනි (4) ගැටි වැල මගිනි

23. මෙම බෙරයේ සම්මත දිග ප්‍රමාණය වනුයේ
(1) තුන් වියත් තුනඟුලයි (2) එක් වියත් තුනඟුලයි
(3) එක් වියතයි (4) සත් බඹ සතයි

24. ගැටබෙර වාදනයේ දී යොදා ගනු ලබන සතර බීජාක්ෂර වන්නේ
(1) තත්, දිත්, දොං, නං ය (2) තත්, ජිත්, තොං, නං ය
(3) තත්, දිත්, ගුඳ, දිත් ය (4) තත් තත් ජිත් ජිත් ය

25. ඉහත වාද්‍ය භාණ්ඩයේ කඳ සකස් කිරීම සඳහා යොදාගන්නා දැව වර්ගයක් වනුයේ
(1) කිතුල් (2) තල් (3) ඇහැල (4) මාර

26. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනෙහි නර්තන රංග වස්ත්‍රාභරණ සැකැසීම සඳහා බහුලව භාවිතා කරන වර්ණ වනුයේ
(1) කළු, කොළ (2) නිල්, කළු (3) සුදු, රතු (4) කළු, රතු

27. දෙවොල් මඩු ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි දෙකකි.
(1) තොට පේ කිරීම, මඩු පේ කිරීම (2) කප් සිටුවීම, තොට මෙට යාම
(3) මල් පේ කිරීම, හඟලේ යදීම (4) ආභරණ, වැඩම වීම, හඟලයැ දීම

28. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වේ
(1) කළුන්දෑව, පහතදුම්බර, කළුතර (2) හේවාහැට, මාතර, බෙන්තර
(3) මාතර, බෙන්තර, මහනුවර (4) රයිගම, මාතර, බෙන්තර

29. පොකුරු බෙරය මෙනමින් හැඳින්වේ.
(1) තම්මැට්ටම (2) දවුල (3) දෙවොල් බෙරය (4) යක් බෙරය

30. කොහොඹා කංකාරියේ කථා පුවතට සම්බන්ධ පුද්ගල චරිත වේ.
(1) මලරට, වැදිරජ (2) කොහොඹාදෙවි, කඩවර යකු
(3) මලරජ, කුවේණිය (4) සමන්දෙවි, දෙවොල්දෙවි

31. නර්තන කලාවට අධිපති දෙවියන් වන්නේ
(1) සනපති (2) ක්‍රිෂ්ණා (3) රාධා (4) නටරාජා

32. සිංහල ගැමි නැටුම් වල කුළු නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම වන්නේ
(1) චෙම්බු (2) සුලකු (3) කරගම් (4) කුම්මි

33. තාල තැබීම හා ගායනය එක විට ආරම්භ කරනුයේ
(1) සමග්‍රහ (2) විෂමග්‍රහ (3) අවග්‍රහ (4) නවග්‍රහ

34. මාත්‍රා 2 + 3 දෙතිතට අයත් වන්නමකි.
(1) තුරඟා (2) සැවුලා (3) සිංහරාජ (4) හනුමා

35. සැස්සේරුව හා කොරවක්ගල ලෙන් ලිපි දෙක හමුවන්නේ කුමන යුගයේ ද?
(1) ගම්පල (2) අනුරාධපුර (3) මහනුවර (4) දඹදෙණි

36. වෙස් ඇඳුම් කට්ටලයේ අවුල් හැරය පළඳිනු ලබන්නේ
(1) හිසටය (2) පාදවලටය (3) පපුවටය (4) අතටය

37. දේශීය නැටුම් සම්ප්‍රදායන් වලට පොදු වූ මූලික අංගහාරය හඳුන්වනු ලබන්නේ
(1) අර මණ්ඩිය නමිනි (2) මිටි රියන නමිනි (3) දන්ඩියම නමිනි (4) මණ්ඩිය නමිනි

38. පහතරට සිංදු වන්නම්
(1) විසි හතරකි (2) තිස් දෙකකි (3) දහ අටකි (4) විස්සකි

39. ''මහනුවර පෙරහරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්'' යනුවෙන් ලියා ඇත්තේ
(1) රොබට් නොක්ස් ය. (2) ඉබන් බතුතා ය. (3) ස්පිල් බර්ජන්ය. (4) පාහියන් ය.

40. ''අපි දූන් දක්වමු මේ රඟ සබයට'' මෙම කවි පදය ඇතුළත් ගැමි නැටුම වන්නේ
(1) චාමර නැටුමය (2) රබන් නැටුමය (3) කුළු නැටුමය (4) කළ නැටුමය

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

නම : ............................................ නර්තනය (දේශීය) - II කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

I පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ප්‍රශ්න අංකය යොදා පිළිතුරු සපයන්න.

(i) දෙපානෝ නමැති ගීත නාටකය ............................................................ මහතාගේ නිර්මාණයකි.

(ii) දොළොස්වන පා සරඹය හඳුන්වනු ලබන්නේ ............................................... සරඹය නමිනි.

(iii) ''සන්තොසින් අසනු මැනවි කීම වෙන වෙනා'' යන කවි පදය ........................................... ගායනා විශේෂයට අයත් වේ.

(iv) පා සරඹයක් අවසන් කරනුයේ ............................................ නි.

(v) දෙවන රාජසිංහ රජු සමයේ ලංකාවට පැමිණි විදේශීය වාර්තා කරුවා වන්නේ ........................................ ය.

(vi) සත්වයකුට වන විපතක් පිළිබඳ කියැවෙන වන්නම වනුයේ ........................................................................ ය.

(vii) දෙවොල් දෙවියන් ප්‍රධාන වන ශාන්ති කර්මය නම් කරන්න. .............................................................................

(viii) ''තත් තත් තක්කඩ කඩතක'' යනු ...................................................................... ගොඩ සරඹයේ කස්තිරමයි.

(ix) දෙවොල්මඩු ශාන්ති කර්මයෙහි එන නාට්‍යමය ලක්ෂණ සහිත පෙළපාලි අංග දෙකක් ලියන්න.
(1) ....................................................................... (2) ......................................................................

(x) පුද්ගලයකුගේ ස්වස්ථතාව කෙරෙහි බලපාන සාධක දෙක නම් කරන්න.
(1) ....................................................................... (2) ......................................................................

02. (i) මාත්‍රා 2 + 3 තාලයට බෙර පදයක් ප්‍රස්තාර කරන්න. ලකුණු 4

(ii) මාත්‍රා 3 + 3 (මැදුම්) තනි තිතට රබන් පදයක් ප්‍රස්තාර කරන්න. ලකුණු 4

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව අදාළ තිතට ප්‍රස්තාර කරන්න. ලකුණු 4

03. පහත සඳහන් මාතෘකා 3ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ගැටබෙරය

(ii) චාමර කවි

(iii) විල්සන් ඔලබොඩුව

(iv) ත්‍රිවිධ ලය

(v) ගැමි නැටුම් ලකුණු 4 5 3 = 12

04. (i) ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු 4ක් ලියන්න. ලකුණු 4

(ii) පහන් මඩුවේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කර චාරිත්‍ර විධි දෙකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. ලකුණු 4

(iii) කොහොඹා කංකාරියේ කථා ප්‍රවෘත්තිය ඇසුරින් සමාජයට දෙන සාරධර්ම ලැබෙන ආකාරය පිළිබඳ විස්තර කරන්න. ලකුණු 4

05. (i) නර්තන කලාව පිළිබඳව තොරතුරු ඉදිරිපත් කළ දේශාටන වාර්තා කරුවන් දෙදෙනෙකු නම් කර ඉන් එක් වාර්තාවක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ii) අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවති ආකාරය පිළිබඳව මහාවංශයේ දැක්වෙන සාධකයක් ඇසුරින් විමසුමක් කරන්න. ලකුණු 4

(iii) පොළොන්නරු යුගයේ නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට කරුණු දෙකක් ඇසුරින් විමසන්න. ලකුණු 4

06. (i) ගැමි නැටුම් 4ක් නම් කරන්න. ලකුණු 4

(ii) ගැමි නැටුම් වල ඇති සුවිශේෂී ලක්ෂණ 4ක් ලියන්න. ලකුණු 4

(iii) ගැමි නැටුමෙන් පෙන්වා දෙන සාරධර්ම හා විශ්වාස පිළිබඳ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. ලකුණු 4

07. (i) පුද්ගලයකුගේ මනස නිරෝගීව තබා ගැනීම සඳහා බලපාන කරුණු 4ක් ලියන්න. ලකුණු 4

(ii) රූපවාහිනී නාලිකාවල විකාශය වන නර්තන වැඩ සටහන් 4ක් නම් කර ආධුනික නර්තන ශිල්පියෙකුට ඉන් ලබාගත හැකි ප්‍රයෝජන 4ක් නම් කරන්න. ලකුණු 4

(iii) නර්තනය හැදෑරීම තුළින් පුද්ගලයකු තුළ වර්ධනය කරගත හැකි සාරධර්ම පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. ලකුණු 4

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 44 | S | I - II |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

### නර්තනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 11. | (4) | 21. | (4) | 31. | (4) |
| 2. | (3) | 12. | (1) | 22. | (3) | 32. | (2) |
| 3. | (4) | 13. | (4) | 23. | (1) | 33. | (1) |
| 4. | (1) | 14. | (3) | 24. | (2) | 34. | (1) |
| 5. | (2) | 15. | (3) | 25. | (3) | 35. | (2) |
| 6. | (4) | 16. | (1) | 26. | (3) | 36. | (3) |
| 7. | (1) | 17. | (1) | 27. | (2) | 37. | (4) |
| 8. | (2) | 18. | (2) | 28. | (4) | 38. | (2) |
| 9. | (1) | 19. | (3) | 29. | (1) | 39. | (3) |
| 10. | (3) | 20. | (1) | 30. | (3) | 40. | (1) |

### II පත්‍රය

01. (i) W.B මකුලොළුව මහතා
(ii) චන්ද්‍රිකා සරඹය
(iii) රබන්
(iv) හමාර පදය
(v) රොබට් නොක්ස්
(vi) සිංහරාජ
(vii) දෙවොල් මඩුව
(viii) 12 වන
(ix) දෙවොල් ගොඩ බැසීම/අඹ විදමන/මරා ඉපැද්දීම ආදී වශයෙන් ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(x) (1) මානසික සාධක (2) කායික සාධක

02. (i) ප්‍රස්ථාරයේ වගුගත කිරීමට හා තාල සංඥාවට ල. 02
බෙර පදය නිවැරදිව ප්‍රසස්ථාර කර ඇත්නම් ල. 02
(ii) ප්‍රස්ථාරයේ වගුගත කිරීමට හා තාල සංඥාවට ල. 02
රබන් කවිය නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ල. 02
(iii) සිංහරාජ වන්නමේ නිවැරදි වගුවට හා තාල සංඥාවට ල. 02
අඩව්ව නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ල. 02

03. මේවායින් තුනක් පිළිබඳ කෙටි සටහන් ලියා ඇත්නම් ල. 4 5 3 = 12

04. (i) සශ්‍රීකත්වය, සෞභාග්‍ය, ලෙඩ රෝග නිවාරණය අධ්‍යාපනික අරමුණු.. ආදී වශයෙන් ලියා ඇත්නම් ල. 04
(ii) සමන්දෙවියො, පත්තිනි, විෂ්ණු, කතරගම ආදී වශයෙන් නම් කර චාරිත්‍ර විධි 2ක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ල. 4
(iii) මඩු සැරසිලි, අයිලය, යක්ගෙය, යහන ආදී සැරසිලි
වෛරය, ක්‍රෝධය නොගැළපෙන විවාහ අඹුසැමි සබඳතා අනෝන්‍ය සම්බන්ධය ආදී වශයෙන් ලියා ඇත්නම් ල. 04

05. (i) ස්පිල් බර්ජන්, රොබට් නොක්ස්, ඉබන්බතූතා ල. 02
එක් සාධකයක් පිළිබඳ විස්තර ලියා ඇත්නම් ල. 02
(ii) සාධකයක් ඇසුරින් විස්තර කර ඇත්නම් ල. 04

(iii) පොළොන්නරු යුගයේ ඓතිහාසික සාධක ඇසුරින් කරුණු විමසුමට ලක්කර තිබේනම් ල. 04

06. (i) ලී කෙළි, කළ, කුළු, රබන්, මෝල්ගස්, චාමර ආදී 4ක් ලියා ඇත්නම් ල. 04

(ii) සරල බව, සාමූහික බව, උපකරණ භාවිතය, එම ගායනය ල. 04

(iii) ඉර හඳ, බුදුන් දෙවියන්, ග්‍රහතාරකා, සාමූහිකත්ව ආදී කරුණු පිළිබඳ විස්තර ඇත්නම් ල. 04

07. (i)
- තමා ජීවත් වන පරිසරය
- අන්තර් පුද්ගල සම්බන්ධතා
- චිත්ත වේග සමබරතාව
- අධික මානසික පීඩනය
- දෛනික ක්‍රියාකාරකම් පිළිවෙළ

ල. 04

(ii) නර්තනය හැදෑරීම තුළින් පුද්ගලයා තුළ වර්ධනය කරගත හැකි සාරධර්ම පිළිබඳ අදහස් දක්වා ඇත්නම් ල. 04